සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **40කි.**

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

---

(01) සිදුහත් බෝසත් කුමරුට අවශ්‍ය ශිල්ප ඉගැන්වීම් කටයුතු සිදුකළේ,

(1) අසිත තාපසතුමා ය. (2) සර්වමිත්‍ර බමුණු පඬිවරයා ය.

(3) කොණ්ඩඤ්ඤ බමුණු පඬිවරයා ය. (4) අළාරකාලාම තවුසා ය.

(02) දහම් ගුණ වන්දනා කරන ගාථා පාඨය වන්නේ,

(1) ඉතිපි සෝ භගවා..... ආදී ගාථා පාඨයයි.

(2) ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ.... ආදී ගාථා පාඨයයි.

(3) සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ.... ආදී ගාථා පාඨයයි.

(4) නමෝ තස්ස භගවතෝ අරහතෝ.... ආදී ගාථා පාඨයයි.

(03) සිංහල ජන ජීවිතය සකස් කිරීමෙහිලා කුරුණෑගල යුගයේ ලියැවුණු පන්සිය පනස් ජාතක පොත් වහන්සේ සඳහා මූලාශ්‍ර වූ පාලි ග්‍රන්ථය වූයේ,

(1) පාලි ජාතකට්ඨ කතාවයි. (2) පාලි බෝධි වංශයයි.

(3) පාලි දාඨාවංශය යි. (4) පාලි ධම්මපදට්ඨ කථාවයි.

(04) සෝවාන් ආදී මාර්ග සිතිවිලි පහළවන සිව්සස් අවබෝධ කර ගන්නා දැක්ම,

(1) කම්මස්සකතා සම්මා දිට්ඨිය යි.

(2) මාර්ග සම්මා දිට්ඨිය යි.

(3) ධ්‍යාන සම්මා දිට්ඨිය යි.

(4) විදර්ශනා සම්මා දිට්ඨිය යි.

(05) අවිධිමත් හා ගිජුලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙක- බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. ඒ අනුව අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් ආහාර ගන්නා තරමට කෑමට ගිජු වූ තැනැත්තා හඳුන්වා ඇත්තේ,

(1) භුත්තවමිතක නමින් ය. (2) කාකමාසක නමින් ය.

Department of Education – Western Province

(3) තත්ථාවට්ටක නමින් ය. (4) අලංසාටක නමින් ය.

(06) සස ජාතක කතාවෙන් ප්‍රකට වන්නේ බෝසතාණන් වහන්සේගේ.....
(1) දාන පාරමිතාවයි. (2) මෛත්‍රී පාරමිතාවයි.
(3) දාන පරමත්ථ පාරමිතාවයි. (4) මෛත්‍රී පරමත්ථ පාරමිතාවයි.

(07) පුරාණයේ සිංහල රජවරුන් මාඝාත ආඥාව නමින් ආඥාවක් පැනවූයේ,
(1) භික්ෂු භික්ෂුණී දෙපිරිසගේ ජීවිත සුරක්ෂිත කිරීමටයි.
(2) උපාසක උපාසිකාවන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමටයි.
(3) තිරිසන්ගත සතුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමටයි.
(4) අවට පරිසරයේ පැවැත්ම සුරක්ෂිත කිරීමටයි.

(08) පත්තකම්ම සූත්‍රයේ පංච බලි නමින් යුතුකම් පහක් දේශනා කොට ඇත. එහි පුබ්බපේත බලි යනුවෙන් දේශනා කර ඇත්තේ තමන් ඉපැයූ ධනයෙන්,
(1) ඥාතීන්ට සැලකීමයි.
(2) ආගන්තුක සත්කාරයයි.
(3) රජයට යුතුකම් ඉටුකිරීමයි.
(4) මියගිය ඥාතීන්ට පිං අනුමෝදන් කිරීමයි.

(09) චක්කවත්ති සීහනාද සූතයට අනුව ''මහණෙනි, දුප්පතුන්ට ධනය නූපදනා කල්හි දිළිඳුකම වැඩිවිය. දිළිඳුකම වැඩිවීම නිසා සොරකම වැඩිවිය. සොරකම වැඩිවීම නිසා.....
(1) අවි ආයුධ බහුල විය. (2) ප්‍රාණඝාතය ඇතිවිය.
(3) බොරු, කේලාම් ඇතිවිය. (4) අනිසි කාම සේවනය ඇතිවිය.

(10) ''ජිගච්ඡා පරමා රෝගා......'' යන පාලි පාඨයෙන් අදහස් වන්නේ,
(1) කුසගින්න ලොව බලවත් ම රෝගය බවයි.
(2) පිපාසය ලොව බලවත් ම රෝගය බවයි.
(3) නිදිමත ලොව බලවත් ම රෝගය බවයි.
(4) අලසකම ලොව බලවත් ම රෝගය බවයි.

(11) තම ධාර්මික ධනය රාජසන්තක වීමෙන්, සොරුන් අතට පත්වීමෙන්, ගින්නෙන් හෝ ජලයෙන් විනාශ වේ. මේ පිළිබඳව තොරතුරු සඳහන් සූත්‍ර දේශනාව වන්නේ,
(1) සිගාලෝවාද සූත්‍රයයි. (2) අණන සූත්‍රයයි.
(3) ව්‍යග්ගපජ්ජ සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

(12) ස්තූපයක අංග අනුව සතරැස් කොටුවෙන් සංකේතවත් වන්නේ,
(1) සිව්බඹ විහරණයන් ය. (2) සතර ඍධිපාදයන් ය.
(3) සතර වරම් දෙවිවරුන් ය. (4) චතුරාර්ය සත්‍ය ධර්මයන් ය.

(13) සතර සංග්‍රහ වස්තුවට අනුව අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම
(1) දානයයි. (2) ප්‍රිය වචනයයි.
(3) අර්ථ චර්යාවයි. (4) සමානාත්මතාවයයි.

Department of Education – Western Province

(14) බුදුරජාණන් වහන්සේගේ රූප සම්පත්තිය හෙවත් බාහිර පෞරුෂය කෙරෙහි ප්‍රසාදයක් ඇතිකර ගත් භික්ෂූන් වහන්සේ,

(1) ආනන්ද හාමුදුරුවෝ ය. (2) අස්සජි හාමුදුරුවෝ ය.
(3) දේවදත්ත හාමුදුරුවෝ ය. (4) වක්කලී හාමුදුරුවෝ ය.

(15) කැලණි විහාරයේ අලුත් විහාර මන්දිරයේ චිත්‍ර නිර්මාණය කරමින් නව චිත්‍ර සම්ප්‍රදායක් හඳුන්වා දුන් චිත්‍ර ශිල්පියා වන්නේ,

(1) සෝමබන්ධු විද්‍යාපති මහතා ය. (2) සෝලියස් මෙන්ඩිස් මහතා ය.
(3) ඇල්බට් ධර්මසිරි මහතා ය. (4) ජෝර්ජ් කීට් මහතා ය.

(16) අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් ආදී සාරධර්ම ප්‍රකට කෙරෙන සූත්‍ර දේශනාවක් වන්නේ,

(1) චූල්ලහත්ථි පදෝපම සූත්‍රය යි. (2) මහාහත්ථි පදෝපම සූත්‍රයයි.
(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) ධම්මචක්කපවත්තන සූත්‍රයයි.

(17) මෙරට දේශහිතෛෂී පිරිස සමඟ එක්ව පරම විඥානාර්ථ නම් බෞද්ධ සමාගම පිහිටුවීමට මූලිකව කටයුතු කරනු ලැබුයේ,

(1) ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා ය.
(2) ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමා ය.
(3) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.
(4) රුසියානු ජාතික බ්ලැවැට්ස්කි මැතිණියයි.

(18) පංච නීවරණයට අනුව සිත් කය දෙකෙහි උදාසීන බව විස්තර කරන නීවරණ ධර්මය නම්,

(1) ව්‍යාපාද නීවරණයයි. (2) ථීනමිද්ධ නීවරණයයි.
(3) උද්ධච්ච කුක්කුච්ච නීවරණයයි. (4) විචිකිච්ඡා නීවරණයයි.

(19) ශිෂ්ට සම්පන්න ප්‍රීතිමත් අඹු සැමි ජීවිතයක් ගත කිරීමට නම්, පංච ශීලයෙහි,

(1) පළමු සිල්පදය ආරක්ෂා කළ යුතු ය. (2) දෙවන සිල්පදය ආරක්ෂා කළ යුතු ය.
(3) තෙවන සිල්පදය ආරක්ෂා කළ යුතු ය. (4) පස්වන සිල්පදය ආරක්ෂා කළ යුතු ය.

(20) සත්වයාගේ සංසාර ගමන සම්බන්ධයෙන් ඇතිවන විෂමතා පිළිබඳව චූල්ලකම්ම විභංග සූත්‍රයේ අගනා විවරණයක් දක්නට ලැබේ. මෙම සූත්‍රය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළේ,

(1) සිගාල නම් ගෘහපතියාට ය.
(2) කෝසල රජතුමාට ය.
(3) කාලාම ගෝත්‍රිකයන්ට ය.
(4) තෝදෙය්‍ය පුත්‍ර සුභ නම් මානවකයාට ය.

(21) සියලු සත්වයින්ගේ උපත හා මරණය දැකීම සඳහා උපකාරී වන නුවණ නම්,

(1) පුබ්බේ නිවාසානුස්සති ඥාණයයි. (2) චුතූපපාත ඥාණයයි.
(3) දිබ්බ චක්ඛු ඥාණයයි. (4) පරචිත්ත විජානන ඥාණයයි.

Department of Education – Western Province

(22) පාරමිතා ධර්ම පුහුණු කරන්නෙක් සම්පූර්ණ කළයුතු ගුණධර්ම ගණන කීය ද?

(1) 5කි. (2) 10කි. (3) 20කි. (4) 30කි.

(23) චිංචිමානවිකාව හා දේවදත්ත හිමියන් සම්බන්ධ කතාපුවත් වලින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ,

(1) මෙත්තා හෙවත් මෛත්‍රී ගුණයයි.

(2) කරුණා ගුණයයි.

(3) අරහං ගුණයයි.

(4) තාදී ගුණය හෙවත් නොසැළෙන ගුණයයි.

(24) උට්ඨාන වීර්යයෙන්, දැතේ මහන්සියෙන්, දහදිය වගුරුවා ධාර්මිකව උපයාගත් ධනය පරිභෝජනය කිරීමේ සැපය නම්,

(1) අත්ථි සුඛය යි. (2) භෝග සුඛය යි.

(3) අණන සුඛය යි. (4) අනවජ්ජ සුඛය යි.

(25) භික්ෂූන් වහන්සේලාගේ නිරෝගී බව වෙනුවෙන් සක්මන් මළුව අනුදැන වදාරණ ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ,

(1) ජීවක වෛද්‍යවරයා ය. (2) සුද්ධෝදන රජතුමා ය.

(3) අනාත පිණ්ඩික සිටුතුමා ය. (4) විශාඛා සිටු දේවිය ය.

(26) කෝලිත - උපතිස්ස දෙදෙනා ගිහි ජීවිතය අතහැර ධර්මය සොයා යන ගමනේ ඔවුන් අතරින් උපතිස්ස පිරිවැජියාට පළමුවෙන් හමු වූ ගුරුවරයා වූයේ,

(1) කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ ය. (2) වප්ප තෙරුන් වහන්සේ ය.

(3) මහානාම තෙරුන්වහන්සේ ය. (4) අස්සජි තෙරුන් වහන්සේ ය.

(27) පහත සඳහන් පිළිතුරු අතරින් ත්‍රිලක්ෂණය වන්නේ.

(1) දාන, සීල, භාවනා යන්නයි. (2) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන්නයි.

(2) ශාරීරික, පාරිභෝගික, උද්දේශික යන්නයි. (4) සීල, සමාධි, ප්‍රඥා යන්නයි.

(28) විපාක දෙන කාලය අනුව කර්මය සතරාකාරය. ඒ අතරින් අපරාපරිය වේදනීය කර්ම යනු,

(1) මෙලොවදී විපාක දෙන කුසලාකුසල කර්මයන් ය.

(2) දෙවන භවයේ දී විපාක දෙන කුසලාකුසල කර්මයන් ය.

(3) දෙවන ආත්ම භවයෙන් පසු කවර හෝ ආත්ම භවයක ද විපාක දෙන කුසලාකුසල කර්මයන් ය.

(4) විපාක දීමට ඉඩ නොලැබීමෙන් අහෝසි වී යන කුසලාකුසල කර්මයන් ය.

(29) ත්‍රිපිටකධාරි මහ තෙරුන් වහන්සේලා හා ධර්මය විනාශ වීමේ අවධානම හේතුපාදක කොට ධර්මය ග්‍රන්ථාරූඪ කරමින් පැවැත් වූ සංගායනාව වූයේ,

(1) පළමු ධර්ම සංගායනාවයි. (2) දෙවන ධර්ම සංගායනාවයි.

(3) කණිෂ්ක ධර්ම සංගායනාවයි. (4) අළුවිහාර ධර්ම සංගායනාවයි.

(30) කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ විසූ ධර්ධර හා විනයධර භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ



Department of Education – Western Province

අසමගිය දුරු කර ගැනීමට උපදෙස් දෙමින් බුදුරජාණන් වහන්සේ වදාළේ,

(1) ''සමග්ගා හෝථ මා විවදථ'' යනුවෙනි. (2) ''වයධම්මා සංඛාරා'' යනුවෙනි.

(3) ''චරථ භික්ඛවේ චාරිකං'' යනුවෙනි. (4) ''අප්පමාදෙන සම්පාදේථ'' යනුවෙනි.

(31) ''මම පොත් රචනා කළේ මුදල් හම්බ කිරීමේ අදහසින් නොවේ. මගේ පොතක් කවුරුන් හෝ මුද්‍රණය කළාට මගේ පොත්වල කොටස් උපුටා ගත්තාට මගේ නමක් මකලා වෙන කෙනෙකුගේ නමක් මුද්‍රණය කළාට මගේ නම් කිසි විරුද්ධත්වයක් නැහැ.''

මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ධර්ම දානය පිණිස ම පොත් රචනා කළ මහා ලේඛක ස්වාමින් වහන්සේ නමක් පිළිබඳව ය. මෙම පඬිරුවන වූයේ,

(1) මහාචාර්ය රේරුකානේ චන්දවිමල නාහිමිපාණන් වහන්සේ ය.

(2) අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රය නාහිමිපාණන් වහන්සේ ය.

(3) අසරණ සරණ වැලිවිට සරණංකර නාහිමිපාණන් වහන්සේ ය.

(4) තොටගමුවේ ශ්‍රී රාහුල නාහිමිපාණන් වහන්සේ ය.

(32) ''උත්සාහයෙන් ද, නිවැරදි සිහියෙන් ද යුතු, නිදොස් දේ විමසා බලා කටයුතු කරන..... ආදී අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,

(1) අක්කොධෙන ජිනේ කෝධං.... ගාථා පාඨයයි.

(2) උට්ඨානවතෝ සතිමතෝ..... ගාථා පාඨයයි.

(3) තතං කම්මං කථං සාධු..... ගාථා පාඨයයි.

(4) අත්තනාව කතං පාපං..... ගාථා පාඨයයි.

(33) බුද්ධ කාලීන භාරතීය වජ්ජීන් අනුගමනය කළ රාජ්‍ය ප්‍රතිපත්ති මාලාව නම්,

(1) දස රාජ ධර්මය ය. (2) දස සක්විතිවත් ය.

(3) සතර සංග්‍රහ වස්තු ය. (4) සප්ත අපරිහානි ධර්මය ය.

(34) මුරගලට පිටුපසින් පියගැටපෙළ දෙපස අත්වැලක් ලෙස නිමැ වූ සිංහල කලාකරුවාගේ කලාත්මක නිර්මාණයක් වන්නේ,

(1) දොරටු පාල රූපයයි. (2) කොරවක්ගලයි.

(3) සඳකඩ පහණයි. (4) වාහල්කඩයි.

(35) අටුවා ග්‍රන්ථ තඹ පත්ඉරුවල ලියවා සෙල්මුවා මංජුසාවල බහා ස්තූපවල තැන්පත් කරමින් දහමේ සුරක්ෂිතතාවයට කටයුතු කළේ,

(1) අජාසත් රජතුමා ය. (2) කාලාශෝක රජතුමා ය.

(3) ධර්මාශෝක රජතුමා ය. (4) කණිෂ්ක රජතුමා ය.

(36) පළමු ධර්ම සංගායනාව සඳහා රාජ්‍ය අනුග්‍රහය දැක්වූයේ,

(1) කණිෂ්ක රජතුමා ය. (2) ධර්මාශෝක රජතුමා ය.

(3) කාලාශෝක රජතුමා ය. (4) අජාසත් රජතුමා ය.

(37) කායික හා මානසික රෝගවලින් තොරවීම පුද්ගලයෙකුගේ දියුණුව කෙරෙහි බෙහෙවින් බලපාන්නකි. ඒ අනුව රෝග වැළඳීමට හේතු පාදක වන කරුණු අටක් ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,

Department of Education – Western Province

(1) ගිරිමානන්ද සූත්‍රයයි. (2) සච්චවිභංග සූත්‍රයයි.
(3) රතන සූත්‍රයයි. (4) ආටානාටිය සූත්‍රයයි.

(38) භික්ෂූන් වහන්සේලාගේ නිරෝගී සුවය රැක ගැනීම උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ පැන් වැළඳීමේ දී,
(1) පෙරහන්කඩක් භාවිතා කිරීමට ය.
(2) ජලය උණුකර භාවිතා කිරීමට ය.
(3) උල්පත් ජලය භාවිතා කිරීමට ය.
(4) මැටි භාජනයකින් පැන් වැළඳීමට ය.

(39) දිවා රෑ පින් වැඩෙන කටයුතු කිරීමෙන් මරණින් මතු සුගතියෙහි උපදින බව බුදුරජාණන් වහන්සේ වදාළේ,
(1) කොසොල් රජතුමාටය. (2) එක්තරා දේවතාවෙකුට ය.
(3) සක් දෙවිඳුන්ට ය. (4) ආනන්ද තෙරුන්ට ය.

(40) අන් අය පිළිබඳව විරුද්ධවාදී බවක් ඇති වීමට වඩාත් බලපාන්නේ අප තුළ ඇති,
(1) ලෝභයයි. (2) ද්වේශයයි.
(3) මෝහයයි. (4) අවිද්‍යාවයි.

Department of Education – Western Province